# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2298/55 - 2022 සැප්තැම්බර් මස 23 වැනි සිකුරාදා- 2022.09.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය, සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මවිසින් පනවනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 23 වැනි දින,
කොළඹ 01.
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි "**2022 අංක 16 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි**" ලෙස හඳුන්වනු ලැබේ.

2. සංශෝධිත, 2021 ජුනි මස 11 දිනැති අංක 2231/18 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2021 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි, මෙමගින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.


1A - PG 5982 — 406 (2022/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. ඉහතින් සඳහන් කළ 2021 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල අංක 8 දරන රෙගුලාසියේ කෙසේ සඳහන් වුව ද, එම රෙගුලාසිවල **I වන උපලේඛනයේ** ලැයිස්තුගත කර, **8702.40.19, 8702.40.39, 8702.40.59, 8703.80.31, 8703.80.32, 8703.80.33, 8703.80.34, 8704.90.31, 8704.90.32, 8704.90.33, 8704.90.34 හෝ 8711.60.10** යන එච්. එස්. සංකේතයන් යටතේ වර්ග කර ඇති විද්‍යුත් මෝටර් වාහන, සංශෝධිත, 2022 අගෝස්තු 31 දිනැති කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 02/2022 ප්‍රකාරව "වාහන ආනයන බලපත්‍රයක්" ලබා ගෙන ඇති ඕනෑම සුදුසුකම් ලත් තැනැත්තෙකු විසින් ආනයනය කිරීම සඳහා ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් ගුවන් භාර / නෞභාර පත්‍රයේ දිනයට පෙර ස්ථාපිත වලංගු ණයවර ලිපියක් (එල්. සී) ඇතුළුව ඉහත සඳහන් චක්‍රලේඛයේ දක්වා ඇති නියමයන් සහ කොන්දේසිවලට අනුකූල වීම මත අවසර ලබා දෙනු ලැබේ.

4. ඉහතින් සඳහන් කළ 2021 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල අංක 8 දරන රෙගුලාසියේ කෙසේ සඳහන් වුව ද, එම රෙගුලාසි වල **I වන උපලේඛනයේ** ලැයිස්තුගත කර, **8702.40.19, 8702.40.39, 8702.40.59, 8703.80.31, 8703.80.32, 8703.80.33, 8703.80.34, 8704.90.31, 8704.90.32, 8704.90.33, 8704.90.34, 8711.60.10** යන එච්. එස්. සංකේතයන් යටතේ වර්ග කර ඇති විද්‍යුත් මෝටර් වාහන, සංශෝධිත, 2022 අගෝස්තු 31 දිනැති කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 02/2022 ප්‍රකාරව "ආදර්ශණ හෝ ප්‍රදර්ශන අරමුණක් වෙනුවෙන් සාම්පලයක් ලෙස ආනයනය කරන වහනයක් සඳහා ලබා දෙනු ලබන වාහන ආනයන බලපත්‍රයක්" ලබාගෙන ඇති සහ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී ඇති නිෂ්පාදකයාගේ ඕනෑම බලයලත් නියෝජිතයෙකු / බලයලත් බෙදාහරින්නෙකු විසින් ආනයනය කිරීම සඳහා ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් ගුවන් භාර / නෞභාර පත්‍රයේ දිනයට පෙර ස්ථාපිත වලංගු ණයවර ලිපියක් (එල්. සී) ඇතුළුව ඉහත සඳහන් චක්‍රලේඛයේ දක්වා ඇති නියමයන් සහ කොන්දේසිවලට අනුකූල වීම මත අවසර ලබා දෙනු ලැබේ. මෙම රෙගුලාසිවලට අනුව, ඉහත සඳහන් බලයලත් නියෝජිතයෙකුට හෝ බලයලත් බෙදාහරින්නෙකුට සාම්පල ලෙස උපරිම වශයෙන් විද්‍යුත් මෝටර් වාහන මාදිලි තුනක් (03) පමණක් ආනයනය කිරීමට අවසර දෙනු ලැබේ.

5. ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉහත රෙගුලාසි අංක 3 සහ 4 හි සඳහන් විදුලි මෝටර් වාහන රේගු නිෂ්කාශනය සඳහා, එච්. එස්. 87 පරිච්ඡේදය යටතේ වර්ගීකරණය කළ හැකි මෝටර් වාහන ආනයනය කිරීමේ දී අදාළ වන පවතින නීතිරීති සහ රෙගුලාසිවලට යටත්ව අනුමැතිය ලබා දිය යුතු ය.

6. ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් මෙම රෙගුලාසි උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් රේගු ආඥාපනත සහ අදාළ නීතිවල විධිවිධාන අනුව පියවර ගත යුතු ය.

7. කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 02/2022 හි නියමයන් සහ කොන්දේසිවල කිසියම් අර්ථයක් හෝ අර්ථකථනයක් තිබේ නම්, එය කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් ලබා ගත යුතු ය.

8. ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් බලපත්‍ර හිමියාගේ නම සහ ලිපිනය, වාහන ආනයන බලපත්‍ර අංකය, මෝටර් රථ වර්ගය, මිල-රක්ෂණ-ගැල් කුලී වටිනාකම සහ මෙම රෙගුලාසි යටතේ එවැනි විදුලි මෝටර් වාහන(යක්) ආනයනය කළ දිනය යන තොරතුරු ඇතුළත් මාසික වාර්තාවක්, ආනයන හා අපනයන පාලක ජනරාල් වෙත පිටපතක් ද සහිතව කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කල යුතු ය.

9. මෙම රෙගුලාසි, 2023 දෙසැම්බර් 31 දක්වා පමණක් බලාත්මක වේ.

EOG 09 - 0302

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.